# ඇබෑර්තු

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දෙන හා නවීකරණය කරන ලද වාරි කෘෂිකර්මාන්ත මගින් ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම අරමුණු කරගත් නියමු ආදර්ශ ආකෘති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය

# ව්‍යාපෘති කාර්යමණ්ඩලය බඳවා ගැනීම

දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දෙන හා නවීකරණය කරන ලද වාරි කෘෂිකර්මාන්ත මගින් ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම අරමුණු කරගත් නියමු ආදර්ශ ආකෘති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) අංක 02/2026 දරන චක්‍රලේඛය සහ රජයේ බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුකූලව, පූර්ණ කාලීන "කොන්ත්‍රාත් පදනම" මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලත්, කැපවීමෙන් කටයුතු කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

තනතුරට අදාළ වේතනය 2026.03.28 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) අංක 02/2026 දරන චක්‍රලේඛයේ 02 වන උපලේඛනයේ 01 වන තීරුවේ සඳහන් වන අතර, මූලික සුදුසුකම් සහ පළපුරුදු අවශ්‍යතා එම චක්‍රලේඛයේ 01 වන උපලේඛනයේ 01 වන තීරුවේ විස්තර කර ඇත.

| අංකය | තනතුර | කාණ්ඩය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| | **ව්‍යාපෘති කළමනාකරණ ඒකකය** | | |
| 1 | කනිෂ්ඨ සිවිල් ඉංජිනේරු (II) | D | 1 |
| 2 | කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය | 1 |

## සාමාන්‍ය කොන්දේසි

අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය. ඉංග්‍රීසි භාෂා දැනුම, රජයේ රෙගුලාසි පිළිබඳ පරිචය සහ පරිගණක සාක්ෂරතාව අත්‍යවශ්‍ය පූර්ව සුදුසුකම් වේ. ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අතිරේක සුදුසුකමක් ලෙස සැලකේ.

දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් යොමු කළ යුතුය.

වැඩිදුර තොරතුරු සඳහා www.irrigationmin.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න. (ඉහත සඳහන් කළ 02/2026 දරන චක්‍රලේඛය ලබා ගැනීම සඳහා කරුණාකර මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය වෙත පිවිසෙන්න).

කළමනාකරණ සහකාර තනතුර සඳහා වූ වේතනය 2026/03/28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2026 සහ 2025/03/25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව හිමිවන දීමනා සහිතව රජය විසින් අනුමත කරන ලද වැටුප් පරිමාණයට අනුකූල වේ.

අයදුම්පත් 2026 ඔක්තෝබර් 27 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත දැක්වෙන ලිපිනය වෙත ලැබීමට සැලැස්විය යුතු අතර, ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණික බලපෑම්වලට ඔරොත්තු දෙන හා නවීකරණය කරන ලද වාරි කෘෂිකර්මාන්ත මගින් ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම අරමුණු කරගත් නියමු ආදර්ශ ආකෘති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය,**
**ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය,**
**අංක 26, ඉඩම් පරිහරණ ගොඩනැගිල්ල,**
**ජාවත්ත පාර, කොළඹ 05.**

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. කවර හෝ ආකාරයක බලපෑම් කිරීමක් නුසුදුසුකමක් ලෙස සැලකෙන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.**